# සියක්‍රීට්

ඉදිකිරීම් රසායනික ද්‍රව්‍ය හා ආලේපන

# සුපර්ප්ලාස්ට්

සියල්ල එකට - වැලි + සිමෙන්ති + පොටි

## ඇයි වැලි, සිමෙන්ති, පොටි වලට වෙන වෙනම වියදමක් ?

කපරාරු කලාවේ විප්ලවීය නිපැයුම,
සියක්‍රීට් සුපර්ප්ලාස්ට් කපරාරු බදාමය...




Manufactured by an ISO 9001 2015 Certified Company

## කපරාරු කර කර,
## පොටි ඇදගෙන දගලපු කාලේ ඉවරයි!

- සාමාන්‍ය බදාමයට වඩා ශක්තිමත්
- පිටත හා ඇතුලත භාවිතා කළ හැක
- ඉරිතැලීම් වලට ලක් නොවේ
- නාස්තිය අවමයි
- හැකිලීම් වලට ලක් නොවේ
- සුමුදු හෝ රළු නිමාවකට සුදුසුයි
- දළඹ ගෑම සදහා වඩාත් උචිත වේ

**CEYAKRETE**
construction chemicals & coatings

**SUPERPLAST**
REVOLUTION IN PLASTERING

# විස්තරය

**සියක්‍රීට් සුපර්ප්ලාස්ට්** යනු ISO 9001:2015 තත්ත්ව කළමණාකරණ ක්‍රියාපටිපාටියට අනුකූලව ජාත්‍යන්තරව පිළිගත් අමුද්‍රව්‍ය හා ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදනය කළ කෙලින්ම තීන්ත ආලේප කර ගැනීමට (පොටි භාවිතා නොකොට) උසස් නිමාවකට බිත්ති කපරාරු කර ගැනීම සඳහා භාවිතා කළ හැකි ඉතා අනර්ඝ, ලාභදායි, කාලය සහ ශ්‍රමය පිරිමසන නිෂ්පාදනයකි. මෙම නිෂ්පාදනය පරිසර හිතකාමී වන අතර, වර්ණ ගැන්වීම සඳහා උසස් තත්වයේ මතුපිටක් ලබා දෙයි. පිටත සහ ඇතුලත බිත්ති කපරාරු කිරීම සඳහා ඉතා යෝග්‍ය වේ.

# විශේෂාංග

- වැලි, සිමෙන්ති, පොටි සියල්ල අඩංගු නිෂ්පාදනයකි
- කාලය, ශ්‍රමය හා මුදල් ඉතුරු වෙයි
- පිටත හා ඇතුලත බිත්ති හා තාප්ප සඳහා භාවිතා කළ හැක
- දළඹ ගැමට හා මෝල්ඩින් වල අනර්ඝ නිමාවක් ලබා ගැනීම සඳහා යෝග්‍ය වේ
- අවශ්‍යතාවය අනුව ඉතා සුමුදු හෝ රළු මතුපිටක් ලබා ගත හැක
- සාමාන්‍ය බදාමයට වඩා අමතර බන්ධන ශක්තියකින් යුක්ත වේ
- හැකිලීම්, ඉරිතැලීම් වලට ලක් නොවේ
- වෝල් ෆිලර් අවශ්‍යතාවය ඉතා අඩුය
- උසස් කාර්යක්ෂමතාවයින් යුක්ත වේ
- ජලයට ඉහළ ප්‍රතිරෝධීතාවක් දක්වයි
- අලු හුණු අඩංගු නැත

# භාවිතයට උපදෙස්

## ක්ෂේත්‍රය මතුපිට සකස්කිරීම

අපිරිසිදු ග්‍රීස්, තෙල්, ඉටි වැනි අපද්‍රව්‍ය ඉවත් කර, ක්ෂේත්‍රය පිරිසිදු කරගන්න.
(පෙර තීන්ත ආලේප කල ක්ෂේත්‍ර සඳහා යෝග්‍ය නොවේ)

## මිශ්‍ර කිරීම හා ආලේප කිරීම

**සියක්‍රීට් සුපර්ප්ලාස්ට්** කි.ග්‍රෑ. 25 ක බෑගයක් ජලය ලීටර 5.0 - 6.0 ක් අතර ප්‍රමාණයක් දමා මිශ්‍රණ යන්ත්‍රයක් ආධාරයෙන් හොඳින් මිශ්‍ර කරගන්න. පිරිසිදු කර සාදාගත් ක්ෂේත්‍රයේ **සියක්‍රීට් සුපර්ප්ලාස්ට්** බදාමය පොටි හැන්දකින් පොටි අදින ආකාරයට ආලේප කරන්න.
පළමු ස්ථරය ආලේප කර පැයකට පමණ පසු (ආලේපය යාන්තමින් වියළීමට ආරම්භ වන මොහොතේ) මට්ටම් ලීයක දාරය ආධාරයෙන් කපරාරුව කපා ගන්න. දෙවන ස්ථරය ආලේප කර පොටි හැන්දක් භාවිතයෙන් හොඳින් සුමට කර ගන්න. පැය 24කට පසු තුන්වරක් ජල සාත්තුව කරන්න. දින 3කට පසු 220 වැලි කඩදාසියෙන් කපා ඔප මට්ටම් කර සෝදා හරින්න.

**ඝණකම:** මිලි මීටර 6 (ස්තර (coat) දෙකෙහිම ඝණකම)

**ආවරණය:** වර්ග අඩි 35-40 (ක්ෂේත්‍රයේ මතුපිට ස්වභාවය මත වෙනස් වේ)

**වියලීමේ කාලය:** පැය 24ක් පමණ වේ

**සහතික:** ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ සහතිකය සහ සහතික කළ පරීක්ෂණ වාර්තා

**වර්ණය:** සුදු / අලු

**මිශ්‍රණය තබා ගත හැකි කාලය:** මිශ්‍ර කළ වේලාවේ සිට පැය 2ක කාලයක්

**කල් තබා ගත හැකි කාලය:** සිසිල් වියළි ස්ථානයක ඉහළ තලයක තැබීමෙන් මාස 6ක් කල් තබා ගත හැක


Member of
CRI Group
ESTB 1950

Subsidiary of Ceylon Rubber Industries Ltd.

Ceyalac (Pvt) Ltd.
#10, School Lane,
Colombo 03, Sri Lanka
+94 11 7222252
+94 11 2507770
info@ceyalac.com
www.ceyalac.com

**Sales Hotline: 773 833 929**